චක්‍රලේඛ අංකය : 03/2015

මගේ අංකය : බප/සසේකො/චක්‍රලේඛ-2015
සමුපකාර සේවක කොමිෂන් සභාව (බ.ප.),
අංක : 109, මහ වීදිය,
බත්තරමුල්ල.

2015-09- 09

බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති, දිස්ත්‍රික් ග්‍රාමීය බැංකු, සණස සමිති,
සමුපකාර මණ්ඩල සහ සමුපකාර සමිති/ සංගම් සභාපතිවරුන් වෙත,

**කාර්යය විධිවිධාන සංග්‍රහය 4.6 යටතේ ඇති ප්‍රතිපාදන සංශෝධනය කිරීම**
**4.6.1 සහ 4.6.2 වගන්ති**

2015-07-01 දින සිට ක්‍රියාත්මක වන පරිදි 06/2012 චක්‍රලේඛය අවලංගු කර, පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

4.6.1 සමුපකාර සමිතිවල ඉතිරි බඩු ගණන් ගන්නා කාර්යයන් හි නිරත වන සේවකයින් පැය 12 කට නොඅඩු කාලයක් එම කාර්යයයේ නිරත වන්නේ නම්, රු. 600/- ක් ගෙවිය යුතුය.

4.6.1.1 එම කාර්යයන් අධීක්ෂණය සඳහා පත් කරනු ලබන අධීක්ෂණ මට්ටම හෝ ඊට ඉහළ තනතුරු දරන නිලධාරීන් පැය 12 කට නොඅඩු කාලයක් එම කාර්යයයේ නිරත වන්නේ නම්, රු. 850/- ක් ගෙවිය යුතුය.

4.6.2 සමුපකාර සමිතිවල ඉතිරි බඩු ගණන් ගන්නා කාර්යයන් හි නිරත වන සේවකයින් පැය 6 කට නොඅඩු, එහෙත් පැය 12 කට අඩු කාලයක් එම කාර්යයයේ නිරත වන්නේ නම්, රු. 300/- ක් ගෙවිය යුතුය.

4.6.2.1 එම කාර්යයන් අධීක්ෂණය සඳහා පත් කරනු ලබන අධීක්ෂණ මට්ටම හෝ ඊට ඉහළ තනතුරු දරන නිලධාරීන් පැය 06 කට නොඅඩු කාලයක් එහෙත් පැය 12 කට අඩු කාලයක් එම කාර්යයයේ නිරත වන්නේ නම්, රු. 450/- ක් ගෙවිය යුතුය.

දැනට පවත්නා 4.6.3 සහ 4.6.4 වගන්ති ඒ අයුරින්ම ක්‍රියාත්මක වනු ඇත.

කොමිෂන් සභාවේ නියමය පරිදිය.

එස්. ඒ. එල්. රංගනී,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත් :
01. ප්‍රධාන ලේකම්, බස්නාහිර පළාත
02. ලේකම්, සමුපකාර සංවර්ධන අමාත්‍යාංශය, බස්නාහිර පළාත.
03. බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන කොමසාරිස් සහ සමිති රෙජිස්ට්‍රාර්
04. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ/ගම්පහ/කළුතර)
05. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව
06. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්